**කොවිඩ්-19 සති පාසල**

**2021 - හත්වන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## හත්වන පාඩම - සිතියම් හැඳින්වීම

**සිතියමක් යනු,**

- භූමිය මත දැක්වෙන භෞතික සහ සංස්කෘතික ලක්ෂණ පැතලි තලයක් මත පරිමාණුකූලව ඉදිරිපත් කිරීම සිතියමක් නම් වේ.
- අතීතයේ සිටම මිනිසා තමා ජීවත් වන ස්ථානයේ ලක්ෂණ සැලැස්මකට නැගීමට උත්සුක වී ඇත.
- දැනට අවුරුදු 5000කට පමණ පෙර මෙසපොතේමියානු ජාතිකයෙකු විසින් තමා ජීවත් වන ප්‍රදේශයේ පිහිටීම දක්වන ලද මැටි පුවරුව ලොව පැරණිතම සිතියම ලෙස සැළකේ.
- එසේ ආරම්භ වූ සිතියම්කරණය වර්තමානයේ දියුණු විද්‍යාවක් බවට විකාශය වී තිබේ.
- ප්‍රධාන වශයෙන් සිතියම් වර්ග දෙකකි.
    1. තේමා සිතියම්
    2. භූ ලක්ෂණ සිතියම්
- තේමා සිතියම් මගින් එක් සුවිශේෂී කරුණක් පමණක් ගෙනහැර දැක්වේ. තොරතුරු සංකීර්ණ නොවන නිසා පහසුවෙන් වටහා ගත හැකිය.

**ක්‍රියාකාරකම**

1. සිතියමක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න.
2. දැනට සොයාගෙන ඇති ලොව පැරණිතම සිතියම කුමක්ද?
3. වර්තමානයේ සිතියම්කරණය සඳහා භාවිත කරන නවීන ක්‍රමවේද තුනක් ලියන්න.
4. ප්‍රධාන සිතියම් වර්ග දෙක නම් කරන්න.
5. තේමා සිතියමක් යනු කුමක්දැයි හඳුන්වා උදාහරණ හතරක් ලියන්න
5. තේමා සිතියම්හි ප්‍රයෝජන හතරක් ලියා ඉන් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.